රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ :- 11/2010

මගේ අංකය: EST-7/LEAVE/03/3120
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.
2010.06.30 දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**<u>ජල ගැලීම්, ගංවතුර, සුළි සුළං හා නායයෑම් හේතුකොටගෙන සේවයට නොපැමිණි රජයේ නිලධාරීන් සඳහා විශේෂ නිවාඩු ලබා දීම - 2010 මැයි</u>**

වර්ෂ 2010 මැයි මස දිවයිනේ විවිධ ප්‍රදේශ වල ඇති වූ ජල ගැලීම්, ගංවතුර, සුළි සුළං හා නායයෑම් හේතුකොටගෙන සේවයට වාර්තා කිරීමට අපොහොසත් වූ රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි කටයුතු කරන මෙන් දන්වමි.

02. එම කරුණු හේතුකොටගෙන පොදු ප්‍රවාහන සේවා පහසුකම් නොමැතිවීම නිසා සේවයට පැමිණීමට නොහැකිවීම පිළිබඳව විශේෂ නිවාඩු ඉල්ලීම ගැන සළකා බැලිය යුත්තේ එම නිලධාරීන්ට සේවයට පැමිණීමට නොහැකි වූයේ ඒ ඒ නිලධාරීන් පදිංචි ගම් ප්‍රදේශත්, සේවා ස්ථානයත් අතර ඇති පොදු ප්‍රවාහන සේවාවන්, එම සේවා ස්ථානවලට යාමට නොහැකි වන පරිදි ගංවතුර හේතුවෙන් නතර කර තිබූ නිසා බව සනාථ කිරීමට ප්‍රදේශයේ ග්‍රාම සේවා නිලධාරීගෙන් සහ ප්‍රදේශය භාර ශ්‍රී.ලං.ම.ග.ම. ඩිපෝ අධිකාරිගෙන් ලබා ගන්නා ලද සහතික ඉදිරිපත් කළහොත් පමණකි.

03. ඒවා නිවැරදි බවට පෞද්ගලිකවම සොයා බලා දෙපාර්තමේන්තු ප්‍රධානියාට සෑහීමකට පත්වීමට හැකි නම් පමණක් ගංවතුර වෙනුවෙන් විශේෂ නිවාඩු අනුමත කිරීමට ආයතන ප්‍රධානියාට පුළුවන.

04. මෙම අනුග්‍රහය 2010 මැයි මස දිවයිනේ විවිධ ප්‍රදේශවල ඇති වූ ජල ගැලීම්, ගංවතුර, සුළි සුළං හා නාය යෑම් වෙනුවෙන් පමණක් සීමා වන බව සැලකිය යුතුය.

ඩී. දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය